
# දිට්වා පරදා නැඟිටිමු



සඳසරා මෙත්මන්ති මහකුඹුර

# දිටිවා පරදා නැඟිටිමු

සඳසරා මෙත්මන්ති මහකුඹුර
කතෘ

# දිටිවා පරදා නැඟිටිමු

**සඳසරා මෙත්මන්ති මහකුඹුර**
**කතෘ**

**කතෘගේ වෙනත් කෘති**

**සමනල් යාළුවෝ**
**සාමාලි සහ පුංචි සුරංගනාවි**
**පුංචි පූස් පැටියා**
**අපූරු මිතුදම**

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
8 ශ්‍රේණිය A
2026/05/10

ISBN - 9786242114200

# පිදුම

2019 වර්ෂයේ

මහාමායා බාලිකා විදු පියසට

මුලින්ම මා පැමිණි මොහොතේ

ආදරයෙන් අපි පිළිගත්

එවකට විද්‍යාලයේ

විදුහල්පතිතුමිය ලෙස සේවය කළ

හිමාලි සේනාධීර ගුරු මෑණියන්ට

ඉමහත් ගෞරවයෙන්

මෙම පොත පිළිගන්වමි.

සඳසරා මෙත්මන්ති මහකුඹුර
8 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විද්‍යාලය

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එක්තරා දිනක මුළු දිවයිනටම තදින් වර්ෂාව ඇද හැලුණා. සාලයට වී පොතක් කියවමින් සිටි සෙනුදිගේ හිතට බයක් දැනුණා. සෙනුදි බියෙන් ගැහෙමින් මව ළඟට දිව ගියා.

"අම්මේ, මට ගොඩක් බයයි. හොඳට ම වහිනවා, හුළඟත් වැඩියි" කියමින් සෙනුදි මවට තුරුල් වුණා.

"පුතේ, ඔයා බයවෙන්න එපා. අපි තෙරුවන් ගුණ සිහිකරමු. කිසිම කෙනෙකුට මේ වර්ෂාවෙන් කරදරයක් වෙන්න එපා කියලා"

"හොඳයි අම්මේ, මම බුදුන් වඳින්නම්" සෙනුදි අම්මාට කිවුවා..

කෙමෙන් කෙමෙන් අඳුර වැටී රාත්‍රිය උදාවුණා. සෙනුදිගේ නිවස තිබුණේ මැද මහනුවර. රාත්‍රී හත පමණ වන විට සෙනුදිගේ නිවස අවට ප්‍රදේශයට විදුලිය සැපයුම අඩාල වුණා. මුළු පළාතම අඳුරෙන් වැසි ගියා. හැමෝම නින්දට වැටුණා. ඒත් සෙනුදිගේ අම්මාත් තාත්තාත් නින්දට ගියේ නැහැ. මධ්‍යම රාත්‍රී දොළහ පමණ වනවිට තාත්තාගේ කෑ ගැසීමේ හඬට සෙනුදි අවදි වුණා.

සෙනුදි ජනේලයෙන් වටපිට බැලුවා. තාත්තා විදුලිපන්දම දල්වා අවට බැලුවා. කන්ද දෙස සිට මඩ වතුරක් ගලාගෙන එනබව දුටු තාත්තා "කන්ද නාය යන්නයි සූදානම" කියමින් කෑ ගසමින් සෙනුදිලා සමඟ වේගයෙන් ඈතට දිව ගියා.

ගතවූයේ නිමේෂයකි. ඔවුන්ගේ ඇස් ඉදිරිපිටම ඔවුන් සිටි නිවස මෙන්ම අසල්වැසි නිවෙස් ද නායයෑමට හසුවී විනාශ වුහ. සෙනුදිලද ඔවුන්ගේ නිවසේ සිටියානම් මේ වන විට නායට බිලිවී ඇත. අවට නිවෙස් දෙස බැලූ සෙනුදි බියෙන් වෙවුලන්නට විය. සෙනුදිලා ඔවුන්ට කතා කළත් ඔවුන්ට එය ඇසුණේ නැත්තේ ඔවුන්



දොරගුළු දා නින්දේ සිටි නිසා යැයි අනුමාන කළහ. ඔවුන්ට කුමක් සිදුවී ඇත්දැයි විමසිල්ලෙන් බැලුහ.

දුරකථනය අතට ගත් සෙනුදිගේ පියා යුධ හමුදාවට ඇමතුමක් දී සිදුවූ සියල්ල කියූ නමුත් ඔවුන්ටද පැමිණීමට තරමක වෙලාවක් ගතවූයේ මාර්ග සියල්ල විනාශ වී තිබූ නිසාය.

යුධ හමුදා ඇතුළු සහන කණ්ඩායම් එනතුරු සෙනුදිගේ පියා තවත් අයෙකු සමඟ එක්වී අනතුරට පත්වූ අය සොයා ගැනීමට මහත් වෙහෙසක් දැරීය. අලුයම තුන වන විට ඔවුන්ට පසට යටවී සිටි කිහිපදෙනෙකු සොයා ගැනීමට හැකිවිය. ඒ සමඟ පැමිණි යුධ හමුදා නිලධාරින් නායට හසුවූ අය සෙවීමේ කටයුතු ආරම්භ කළහ. ඔවුන් සුන්බුන් අතර සිරවී සිටි මිනිස්සු හත්දෙනෙක් බේරාගෙන කරමත තබාගෙන රැගෙන ආ නමුත් ඔවුන් හිටියේ අවසිහියෙනි. සිහින් කෙඳිරිලි හඬ නඟමින් ඔවුන් වේදනාවෙන් කෑ ගැසුහ. ගිලන්රථ පැමිණ වහාම ඔවුන් රෝහල් වෙත රැගෙන ගියා.

එදින අලුයම පහ පමණ වනවිට සෙනුදිලාගේ ගමට තවත් අවාසනාවන්ත සිද්ධියක් අහන්න ලැබුණා. ගමේ හැමෝම සෙන්දිරිස්ලාගේ පවුල ලෙස කතා කළ එම පවුලේ සියලුම දෙනා මියගොස් සිටියා.

සෙන්දිරිස් පවුලේ අයගේ මෘත දේහ දුටු සෙනුදිගේ දෑස්වලට කඳුලු ගලා ආවාය. මන්ද සෙනුදි මවත්, පියාත් සමඟ එම නිවසට නිතර ආගිය නිසාය. සෙනුදි ප්‍රාර්ථනා කළා ඔවුන්ට මතු භවයක මෙවැනි අකල් මරණයකට මුහුණ පාන්න සිදු නොවේවා කියා.

උදෑසන හය පමණ වුණා. තවමත් විපතට පත්වූවන් මුදාගැනීම සිදුවනවා. අධික වර්ෂාව ඊට බාධාවක් වුවත් හමුදා

සෙබලුන් එය නොතකා දැඩි කැපවීමෙන් එම කටයුතුවල නිරත වුණා. තවත් දහනව දෙනෙකු පස් අතර යටවී සිටින බව සෙනුදිගේ තාත්තා කිවුවා.

මේ අතර සෙනුදිලා ගමේ පන්සලේ ඇති කඳවුරකට යොමු කළා. විපතට පත් වි බේරුණු හැමෝම දැන් ඉන්නේ කඳවුරක සෙනුදිලාට අවශ්‍ය සියලුම දේ ගුවන් මගින් ගෙනවිත් ලබාදුන්නා. මුළු රටේම ජනතාව එකතුව විවිධ ආයතනවල සහයෝගයෙන් ඒවා ලබාදුන් බව ග්‍රාම නිලධාරි තුමා පැවසුවා.

සෙනුදිලා නවාතැන් ගත් කඳවුරේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන සියලු ජාතින්වල අය සිටියා. සෙනුදිලාගේ ගමේ මේ සියලු ජාතින් ජීවත් වුණා. ඔවුන්ගේ ජීවනෝපාය වූයේ තේ කර්මාන්තයේ යෙදීමයි. එයින් බොහෝ දෙනෙක් තේ දළු නෙලීම සිදුකළා. මේ හැමෝම දුක් මහන්සි වෙලා හදාගත්ත නිවාස සියල්ල දැන් ඔවුන්ට අහිමි වෙලා. කඳවුරේ සිටි හැමෝම හිටියේ හරිම දුකෙන්. සමහර පවුල්වල අම්මා, තාත්තා, සහෝදරයන් මිය ගොස් සිටියා. මුළු ගමම මල ගෙයක් වුණා. ඒක පුංචි හිත්වලට දරාගන්න අමාරු වුණා.

පසුදා උදෑසන රජයේ නිලධාරින් කීපදෙනෙකු කඳවුරට පැමිණියා. එහි සිටි නිලධාරියෙකු ප්‍රකාශ කලේ අපි මුහුණ දුන්නේ ‘‘දිට්වා‘‘ නම් කුණාටුවකට බවයි. මෙයින් ලංකාවේ බොහෝ පළාත්වලට හානි සිදුවූ බවත්, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගම්පොළ, බදුල්ල වැනි ප්‍රදේශවලට දැඩි හානි සිදුවූ බවත් ප්‍රකාශ කළා.

නොවැම්බර් 28 වන දිනවන විටත් වර්ෂාව එලෙසම පැවතුණා. තවමත් සෙනුදිලාගේ ගමට විදුලි සැපයුම හා ජල සැපයුම අඩාලයි. නමුත් සෙනුදිලා සිටි කඳවුරට අවශ්‍ය ජලය රැස්කර තිබුණා.

මේ අතර සෙන්දිරිස්ලාගේ පවුලේ අයගේ අවසන් කටයුතු සිදුකළා. ඔවුන් මිහිදන් කළ මොහොතේ එහි රැස්ව සිටි සියලු දෙනාම දැඩි කම්පනයකටත්, වේදනාවටත් පත්ව සිටියා. අවසන් කටයුතු නිමවීමෙන් පසු ඔවුන් නැවත කඳවුරට ගියහ.

රාත්‍රිය උදාවුණා. සෙනුදි ඇතුළු කඳවුරේ සිටි සියල්ලන්ම බිම මෙට්ට, පැදුරු වැනි දෙයක් අතුරාගෙන නින්දට ගියා. නොවැම්බර් 29 දින ද උදාවුණා. අදත් උදෑසනම සෙනුදිලාට දැන ගැනීමට ලැබුණේ තවත් දුක්මුසු පුවතක්. නායට හසුවූ තවත් පිරිසකගේ මෘතදේහ හමුවූ බවත්, ඒවා හඳුනාගත නොහැකි ලෙස තිබූ බවත් එබැවින් රාත්‍රියේම ඒවා මිහිදන් කළ බවත්, දැන ගත්තා. සෙනුදිට ඒ වෙලාවේ හිතුණේ, සෙනුදිගෙ අම්මාත් තාත්තාත් ඇහැරිලා සිටි නිසා එදා සෙනුදිලාගේ පවුලට ජීවිතය බේරා ගැනීමට හැකිවූ බවයි. සෙනුදිට ඒ වෙලාවේ අම්මා කියූ දෙයක් මතක් වුණා. පුතේ අපි නිතර තෙරුවන් ගුණ සිහිකරමින් සිටි නිසයි මේ විපතින් බේරුණේ යනුවෙන්ය.

සෙනුදි ඇතුලු කඳවුරේ සිටි ළමයින් සඳහා පාසල් පොත්, බෑග්, සපත්තු, ඇඳුම් පැළඳුම්, සෙල්ලම් බඩු, රස කැවිලි අරන් නැන්දලා මාමලා පැමිණියා. හැමෝටම ඒවා ලැබුණා. සෙනුදිට ලැබුණු කතන්දර පොතක තිබූ කතාන්තරය එතන සිටි නංගිලා මල්ලිලාට කියලා දුන්නා. ඒ නිසා ඒ නංගිලා මල්ලිලාගේ හිත් ටිකක් සැනසුණා.

කෙමෙන් කෙමෙන් වැසි තත්වය පහව ගියා. එහෙත් සෙනුදිලාගේ ගමේ අය තවම සිටින්නේ ආරක්ෂිත කඳවුරවල්වලය. මොකද වැසි තත්වය අඩු වුණත් නාය යාමට තවත් ඇති ඉඩකඩ තවමත් වැඩි නිසාය.

නැවත රාත්‍රිය උදාවුණා. නින්දට යාමට සූදානම් වූ සෙනුදිට ඉස්සර අම්මාත්, තාත්තාත් සමඟ එයාගේ ගෙදර එකම ඇඳේ සතුටින්




නිදාගත්ත විදිහ මතක් වුණා. මේ හැමදේම අන්තිමේට හොඳ අතට හැරෙයි කියලා සෙනුදි හිතුවා. තෙරුවන් ගුණ සිහිකරමින් සෙනුදි නින්දට ගියා.

ඔන්න තවත් අලුත් දවසක් උදාවුණා. අද නොවැම්බර් 30 වෙනිදා. අදනම් කාලගුණය ඉතා හොඳ තත්වයට පත්වෙලා. අද සෙනුදිලාගේ ගමට අලුතින් විදුලිය දෙන්න ලයිට් කණු ගෙනාවා. විදුලි රැහැන් ඇද්දා. පස්වරු 1.15 පමණ වනවිට විදුලි සැපයුම ලබා දුන්නා. ඒත් ජල සැපයුම තවම අඩාලයි. සෙනුදිගේ අම්මා කිවුවේ, ජලය ලැබුණත් ඒවා බීමට සුදුසු නැති බවයි. මොකද එම ජලය සපයන ජලාශවලට මිය ගිය සතුන්, මෘත දේහ වගේම විවිධ අපද්‍රව්‍ය එකතු වී ඇති බවයි.

හවස් කාලය ළඟා වෙද්දි ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) සෙනුදිලාගේ ගමේ නිවාස පරික්ෂා කිරීමට පැමිණියා. ඉන්පසු බොහෝ දෙනෙකුට තම නිවාසවල ජීවත්වීමට අවස්ථාව සැලසුණා. ඔවුන්ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් පැමිණ මුදල් වගේම නිවසට අවශ්‍ය කරන බඩු ආදිය ද ලබාදුන්නා. නමුත් අවාසනාවකට මෙන් සෙනුදිලාටත් තවත් පවුල් කිහිපයකටත් මේ සුන්දර මීදුම් වලාවකින් වටවූ මේ සුන්දර ගම හැරදා යාමට සිදුවන බව දැනගන්න ලැබුණා. සෙනුදිගේත් අම්මාගේත්, තාත්තාගේත් දැස්වලින් කඳුලු බිඳු වැගිරුණා. දරාගත නොහැකි වේදනාවක් ඇතිවුණා. මේ සුන්දර ගම වගේම ම එකට සිටි යාළුවෝ ද තනිකර දමා යාමට සෙනුදිගේ සිත ඉඩ දුන්නේ නැහැ.

දුකෙන් සිටි සෙනුදි අමතා සෙනුදිගේ තාත්තා මෙහෙම කිවුවා. ''පුතේ, දැන් අපි අලුත් ජීවිතයක් පටන් ගමු. අපි අලුත් තැනකට යමු. ඔයාට පාළුවකුත් නැති වෙයි. මොකද අපි යන්නේ ඔයාගේ පුංචිගේ ගමට'' යනුවෙන් ප්‍රකාශ කළා. සෙනුදිත් හිස සලා



එය අනුමත කළා.

අම්මා, තාත්තා මියගිය කඳවුරේ සිටි පුංචි ළමයි, රජය විසින් පවත්වාගෙන යන ළමා නිවාසවලට රැගෙන යාමට නිලධාරීන් පිරිසක් පැමිණියා. සෙනුදි ඒ වෙලාවේ ගොඩක් ඇඬුවා. පුංචි යාළුවොත් ඇඬුවා. මේක දැකපු වැඩිහිටි හැමෝගේම දෑස් කඳුලින් බරවී තිබුණා. අනෙක් අය තමන්ගේ නිවාස වලට නැවත ගියා. සෙනුදි අම්මාත්, තාත්තාත් සමඟ පුංචිලාගේ ගෙදර යන්නට සූදානම් වුණා.

ගමනට සූදානම් වූ සෙනුදිගේ පවුලේ අය ගමෙන් පිටවී යාමට පෙර නැවත තමන් සිටි ගෙදර බලන්න ගියා. කඳුළු පුරවාගත් දෙනෙතින් ඒ දෙස බලා සිටි සෙනුදි අවට අසල්වැසි නිවෙස්වල අයට දුක්බරව සුමුදුන්නා. අම්මාත් තාත්තාත් සමඟ ගමන යන්න පිටත් වුණා.

සෙනුදිගේ මුහුණ දෙස බැලූ තාත්තා මෙහෙම කිව්වා. ‘‘පුතේ, අඬන්න එපා. අපි යන්නේ අපිටම කියලා ආයෙත් ආරක්ෂිතව ඉන්න නිවසක් හදන්න. ආයෙත් මේවාගේ කරදරයක් නොවෙන තැනකට. ඔයා දුක් වෙන්න එපා. අපි හැම පාසල් නිවාඩුවකටම ඔයාගේ යාළුවෝ බලන්න ගමට එමු‘‘ යනුවෙන් ප්‍රකාශ කළා.

නුගේගොඩ බලා යාමට පිටත් වූ සෙනුදිලාට මාර්ගය කැඩී තිබූ නිසා වෙනත් මාර්ගයකින් යන්න සිදුවුණා. රථවාහන තදබදයක් තිබුණ නිසාත්, සෙනුදිලා පුංචිගේ ගෙදරට යද්දි රෑ බෝවී තිබුණා. පුංචි සෙනුදි ආදරයෙන් පිළිගෙන තුරුළුකර ගත්තා. පුංචිට ළමයි හිටියේ නැහැ. බාප්පත් හිටියේ විදේශ ගත වෙලා. ඒ නිසා පුංචිත් සෙනුදිලා ආවට ගොඩක් කැමති වුණා. ඇඟපත සෝදාගත් සෙනුදිලා ආහාර ගෙන අවසන් වූ පසු බොහෝ වේලාවක් කතාබහ කරමින් සිටියා. මහන්සිය වැඩි නිසා ඔවුන් නින්දට ගියා.



පසුදාම සෙනුදිගේ තාත්තා අලුත් ඉඩමේ පුංචි ගෙයක් හදන්න වැඩ ආරම්භ කළා. ඒ සඳහා රජයෙන් ලබාදුන් මුදලත් විදේශගත වී සිටින බාප්පා ලබාදුන් මුදල් හා තමන් මෙතෙක් ඉතිරි කර තබාගත් මුදල් ද වැය කළා. ටික කලකින් සෙනුදිලාට ම කියා පුංචි ලස්සන ගෙයක් හදලා අවසන් කළා.

ඔන්න දැන් සිංහල හිංදු අලුත් අවුරුදු දිනයත් උදාවුණා. සෙනුදිලාට මැද මහනුවර ගෙදර මතක් වුණා. හැමෝම දුකින් ඇඬුවා. ඒත් ආයෙත් එය අමතක කර අලුත් ගමේ පන්සලට යන්න පිටත් වුණා. ස්වාමීන් වහන්සේලා සෙනුදිලාට ආශිර්වාද කළා. සෙනුදිගෙ අම්මා අලුතින් ගෙනාපු ලස්සන ඇඳුම් පැළඳුම් හා තවත් තෑගි දැමූ බෑගයක් සෙනුදි අතට දුන්නා. පුංචිත්, අත්තම්මාත් සෙනුදිට බොහෝ තෑගි දුන්නා. සෙනුදි ආසාවෙන් ඒවා බැලුවා. ඒත් ඒ වෙලාවේ එයාට පරණ යාළුවෝ ටික මතක් වුණා. ගමට යද්දි එයාලටත් මම තෑගි අරන් යනවා කියලා සෙනුදි සිතුවා.

කාලය ගතවුණා. විදේශගතවී සිටි සෙනුදිගෙ බාප්පා ලංකාවට ආවා. දැන් පුංචිට ලස්සන පුංචි නංගි බබෙකුත් ඉන්නවා. සෙනුදි එයාලා සමඟ සතුටින් කාලය ගතකළා. සෙනුදිලාට පාසල් නිවාඩු කාලය ආවා. සෙනුදි අම්මාත්, තාත්තාත් සමඟ පුංචිලාගේ වාහනයෙන් මැද මහනුවර ගියා. එහි සිටි යාළුවෝ හැමෝම දැන් සතුටින් සිටින බව සෙනුදි දැනගත්තා. එයාට හරිම සතුටුයි. සෙනුදි යාළුවෝ සමඟ සෙල්ලම් කළා. හවස් වෙද්දි නැවත පුංචිලා සමඟ නුගේගොඩ යන්න පිටත් වුණා. ඒ යන අතරේ සෙනුදි ප්‍රාර්ථනා කළේ නැවත කිසිම දවසක මේ වගේ විපතක් වෙන්න එපා කියලා.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)